# කාව්‍යාදර්ශයෙහි සහ සියබස්ලකරෙහි රූපක ප්‍රභේද පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක්

පී. ඩිල්ෂානි චතුරිකා දාබරේ[1]

සිංහල පද්‍ය සාහිත්‍යයේ කාව්‍ය විචාරයට දුහුනන් යොමු කරනු වස් අනුරාධපුර යුගයේ රජ පැමිණි කීර්ති ශ්‍රී ශිලාමේඝවර්ණාභය (ක්‍රි.ව 846-866) විසින් රචනා කරන ලද 'සියබස්ලකර' අලංකාර විග්‍රහ කිරීමට ප්‍රමුඛස්ථානයක් දුන් කෘතියකි. සර්ග තුනකින් ද ගී 405කින් ද සමන්විත මේ කෘතියට මූලාශ්‍රය වූයේ සංස්කෘත කාව්‍යාදර්ශය යි. නරසිංහ වර්මන් මහාමල්ල නම් පල්ලව රජුගේ රාජ සභා කවියකු වන දණ්ඩීන් 'කාව්‍යාදර්ශයේ' කතුවරයා වේ. කාව්‍යාලංකාර යටතෙහි එන අර්ථාලංකාර ප්‍රභේදයක් වන 'රූපක' පිළිබඳ ව සිංහල කතුවරයකු විසින් ප්‍රාමාණික අධ්‍යයනයක් සිදු කර එහි විශේෂ ප්‍රභේද හඳුනාගනිමින් පළ කළ කෘතියක් එතෙක් දක්නට නො වී ය. ඒ අනුව මේ පර්යේෂණයෙහි අරමුණ වනුයේ සංස්කෘත ආලංකාරිකයකු වන දණ්ඩීන් අනුදත් මඟ යමින් සියබස්ලකරකරු රූපක අරබයා පළ කළ නිර්වචන හා විශේෂ ප්‍රභේද කවරේ ද යනු විමසීම යි. 'කාව්‍යාදර්ශයේ' හා 'සියබස්ලකරේ' රූපක සංසන්දනය කිරීම හා සිංහල පද්‍ය ආශ්‍රයෙන් ඊට නිදර්ශන දැක්වීම මෙහි අරමුණ වෙයි. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පූර්වෝක්ත ග්‍රන්ථද්වයය ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් එහි සංස්කරණ කෘති කිහිපයක් ද යොදාගෙන තිබේ. සමස්තව්‍යස්ත, සකල, අවයව, අවයවී, ඒකාංග ආදි රූපක ප්‍රභේද 18ක් මේ කෘතීන්හි දක්වා ඇති අතර නිදසුන පළමු ව දක්වා දෙ වැනි ව ලක්ෂණ දැක්වීමේ දීත් හැම රූපකයක ම නාමය දැක්වීමේ දීත් දණ්ඩීන්ට වඩා සලමෙවන් රජු වෙනස් මඟක් අනුගමනය කර ඇති බව පෙනේ. සියබස්ලකර කාව්‍යාදර්ශයෙහි පදානුපදික පරිවර්තනයක් නො වේ ය යන මතය රූපක සම්බන්ධයෙන් තරමක සැකයකට තුඩු දෙන කරුණක් බව මෙයින් ප්‍රත්‍යක්ෂ වේ.

**ප්‍රමුඛ පදඃ** සියබස්ලකර, කාව්‍යාදර්ශය, දණ්ඩීන්, කාව්‍යාලංකාර, රූපක

[1] සිංහල අධ්‍යයනාංශය